# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

"පරිසර පියස" , 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web : www.cea.lk


| අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. | CEA/06/EPU/PC&PR/09/2024 | ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. | | දිනය / திகதி / Date | 2024.08.09 |
|---|---|---|---|---|---|

## මාධ්‍ය නිවේදනය

**<u>මහනුවර ඇසළ පෙරහැර සමයේ විධිමත්ව කසළ බැහැර කරන්න</u>**

**- <u>මධ්‍යම පරිසර අධිකාරිය බැතිමතුන්ගෙන් ඉල්ලයි</u>**

වගකීමෙන් යුතුව විධිමත්ව කසළ බැහැර කරන ලෙස මහනුවර ඇසළ පෙරහැර නැරඹීමට පැමිණෙන බැතිමතුන්ගෙන් මධ්‍යම පරිසර අධිකාරිය ඉල්ලා සිටී.

මෙවර මහනුවර ඇසළ පෙරහැර 2024 අගෝස්තු මස 10 වෙනිදා සිට 19 වෙනිදා දක්වා පැවැත්වේ. සාමාන්‍යයෙන් මහනුවර ඇසළ පෙරහැර සමයේ දිනකට ටොන් තුනක පමණ ප්‍රමාණයක පොලිතීන්, ප්ලාස්ටික් ඇතුළු ඝන අපද්‍රව්‍ය එක්රැස් වේ. එම නිසා වසර ගණනාවක් මුළුල්ලේ මධ්‍යම පරිසර අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය, මහනුවර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර නගර සභාව සහ මහනුවර පොලීසිය යන ආයතන වල ප්‍රධානත්වයෙන් කසළ කළමනාකරණ වැඩසටහක් ක්‍රියාත්මක කර ඇත.

මෙහිදී, මධ්‍යම පරිසර අධිකාරිය මධ්‍යම පළාතේ පාසල් 30ක පමණ පරිසර නියමු දරුවන් යොදා ගනිමින් වීථි නාට්‍ය, විරිඳු, ගීත නාටක සහ නැටුම් ආදී විශේෂාංග යොදා ගනිමින් අගෝස්තු මස 10, 14, සහ 15 සිට 19 වැනි දා දක්වා කසළ කළමනාකරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.

කසළ බැහැර කරන ස්ථාන වෙත පමණක් කසළ බැහැර කිරීමෙන් ද පොලිතීන් ප්ලාස්ටික් ඇතුළු නොදිරන ද්‍රව්‍ය භාවිතය හැකිතාක් අවම කිරීමෙන් ද පරිසර රැකගැනීමට එක්වන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය සියලු බැතිමතුන්ට සිහිපත් කර සිටී.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය


| Chairman | Director General | General Office | Complaints Hotline : 1981 | |
|---|---|---|---|---|
| Tel : 2872361,2124605<br>Fax : 2872347 | Tel : 2872359, 2124613<br>Fax : 2872608 | Tel : 2872278, 2873447, 2888999, 2124600 | | |

| Deputy Director Generals | HRD, Admin. & Finance | Envt. Pollution Control | Envt. Mgt. & Assessment | Envt. Edu. & Awareness | Waste Management | Regional Operation |
|---|---|---|---|---|---|---|
| | Tel: 2124610 | Tel : 2124618<br>Fax : 2872605 | Tel : 2124626<br>Fax : 2872296 | Tel : 2124614<br>Fax : 2872609 | Tel : 2124634<br>Fax : 2882152 | Tel : 2124638<br>Fax : 2872275 |




පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment